දකුණු පළාත් වතු සමාජ සංවර්ධන සේවාව විසින් ක්‍රියාවට නංවනු ලබන "නවෝදය" ව්‍යාපෘතියේ 2008 ඔක්තෝබර් සිය 2009 සැප්තැම්බර් දක්වා වන මූල්‍ය වර්ෂය තුළ අප ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශයේ සිදුකරනු ලබන විවිධ ක්‍රියාකාරකම් අංශ හයක් යටතේ පහත දක්වා ඇත.

## ***<u>ක්‍රියාකාරකම්</u>***

### ***<u>සාමාජීය සංවර්ධනය.</u>***

- නවෝදය ව්‍යාපෘතියේ පූර්ණ කාලීන සේවයේ යෙදීසිටින සජීවකයින් සඳහා අවශ්‍ය සමාජ සජීවිකරනය, ඉතිරි කිරීම්, කළමණාකරනය පිළිබඳ පුහුණුවීම් ලබාදීම.
- "කොඩෙසෙජ්" ආයතනයේ සේවකයින් සඳහා ඉංග්‍රීසි භාෂාව සඳහා පන්ති පැවැත්වීම.
- නවෝදය කුඩා කණ්ඩායම් වල නායකයින් සඳහා නායකත්වය, කළමණාකරනය, ඉතිරිකිරීම් හා සකසුරුවම පිළිබඳ පුහුණුවීම් ලබාදීම.
- නවෝදය කුඩා කණ්ඩායම් වල නායකයින් මාස 06කට වරක් හමුවී ඔවුනොවුනගේ අත්දැකීම් බෙදා ගැනීම.
- නවෝදය කුඩා කණ්ඩායම් එකතුකොට "ප්‍රජා මූල සංවිධාන" 30ක් බිහිකිරීම.
- වතු කළමණාකාරිත්වයට, වතු කාර්යය මණ්ඩල වලට හා රජයේ නිළධාරීන්ට "නවෝදය" ව්‍යාපෘතිය ගැන හැඳින්වීමේ වැඩසටහන් සංවිධානය කිරීම.

### ***<u>අධ්‍යාපනය.</u>***

- මාතර දිස්ත්‍රික්කයේ වතු පාසල් 06ක් සඳහා ස්වේච්ඡා ගුරුවරුන් 16 දෙනෙක් පත්කොට ඔවුනට අවශ්‍ය පුහුණුවීම් හා මාසික දීමනාවන් ලබාදීම.
- වතුකරයේ දිළිඳු පාසල් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කරගෙන යෑම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම.
- මාතර දිස්ත්‍රික්කයේ වතු පාසල් වල 05 වසර ශිෂ්‍යත්ව විභාගය හා අ.පො.ස.(සා.පෙළ) විභාගය හදාරන දරු දැරියන් සඳහා සම්මන්ත්‍රන මාලාවන් සංවිධානය කිරීම.
- මාතර දිස්ත්‍රික්කයේ වතු පාසල වල අ.පො.ස.(සා.පෙළ) හදාරන සිසු සිසුවියන් සඳහා සඳහා ගණිතය හා විද්‍යාව විෂයන් සඳහා නොමිලේ උපකාරක පන්ති පැවැත්වීම.
- වතුකරයේ ජීවත් වන අ.පො.ස.(සා.පෙළ) හදාරන දක්ෂ සිසුන් දස දෙනෙකුට ඔවුන්ගේ අධ්‍යාපනය සඳහා මාසිකව ශිෂ්‍යත්ව ලබාදීම.
- වතුකරයේ ජීවත් වන අ.පො.ස.(උ.පෙළ) හදාරන දක්ෂ සිසුන් පහළොස් දෙනෙකුට ඔවුන්ගේ අධ්‍යාපනය සඳහා මාසිකව ශිෂ්‍යත්ව ලබාදීම.
- "නවෝදය" නේවාසිකාගාරයේ සිටින අ.පො.ස.(උ.පෙළ) ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා නොමිලේ උපකාරක පන්ති පැවැත්වීම.
- දකුණු පළාතේ ඇති වතු පාසල් දහය සඳහා යටිතල පහසුකම් සැපයීම.
- මාතර දිස්ත්‍රික්කයේ වතුකරයේ පාසල් යායුතු වයසේ සිටින පාසල් නොයන ළමුන් සඳහා සාක්ෂරතා පාසල් 05ක් ආරම්භ කිරීම හා අදාල ගුරුවරුන්ට අවශ්‍ය පුහුණුවීම්, මාසික දීමනා ලබාදීම හා එම පාසල් වලින් සුදුසුකම් ලබන දරුවන් රජයේ පාසල් සඳහා ඇතුලත් කිරීම.

## සෞඛ්‍ය හා සනීපාරක්ෂාව.

- "නවෝදය" ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන වතු වල වඩාත් විධිමත්ව ක්‍රියාත්මක වන ගෘහ ඒකක 05ක් තෝරාගෙන ඔවුනට ත්‍යාග ලබාදීම.
- "නවෝදය" ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන වතු වල කැඩීබිඳී ගිය ජල ටැංකි හා ජල සම්පාදන මාර්ග 20ක් අළුත්වැඩියා කිරීම.
- "නවෝදය" ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ජල පහසුකම් නොමැති වතු සඳහා නව ජල ටැංකි 20ක් ඉදිකිරීම.
- වතුකරයේ දිළිඳු ජනතාව වෙනුවෙන් ඔවුනගේ අසාධ්‍ය රෝගාබාදයන් සඳහා වෛද්‍ය පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාදීම.

## ආර්ථික සංවර්ධනය.

- වතුකරයේ තෝරාගත් 15 දෙනෙකුට කුකුළු ගොවිපළ 15ක් ඇති කිරීමට අවශ්‍ය පුහුණුවීම්, කුකුළු ගොවිපළ ඉදිකරදීම, කුකුළු පැටවුන් ලබාදීම හා අනෙකුත් උපකරණ ලබාදීම.
- වතුකරයේ තෝරාගත් පවුල් ඒකක 50ක් සඳහා ගෙවතු වගාව පිළිබඳ පුහුණුවීම් ලබාදීම හා ඔවුනට අවශ්‍ය බීජ වර්ග හා උපකරන ලබාදීම.
- "නවෝදය" සජීවකයින් විසින් ආදර්ශ ගෙවතු 04ක් ඇතිකිරීම.
- වතුකරයේ තෝරාගත් තරුණියන් 30 දෙනෙකුට සඳහා මැහුම් පාඨමාලාවක් ආරම්භ කිරීම.
- "නවෝදය" කුඩා කණ්ඩායම් වල ඉතිරිකිරීම් වර්ධනය කිරීම සඳහා මූල්‍ය පහසුකම් ලබාදීම.
- "නවෝදය" සජීවකයින්ට ගෘහස්ථ කළමණාකරනය පිළිබඳ පුහුණුවීම් ලබාදීම හා ඔවුන් මගින් වතුකරයේ ගෘහනියන් සඳහා එම පුහුණුවීම් ලබාදීම.

## සාමය.

- පොලිසිය හා හමුදා නිලධාරීන් අතර සහයෝගයෙන් කටයුතු කිරීම හා වතුකරයේ සිවිල් ආරක්ෂක කමිටු පිහිටුවීමට කටයුතු කිරීම.
- රජයේ නිළධාරීන්ට දෙමළ භාෂාව පිළිබඳ නොමිලේ උපකාරක පන්ති පැවැත්වීම.
- කොටපොළ ප්‍රාදේශිය සභාව තුළ දමිළ භාෂා පරිවර්ථකයකු පත්කිරීම.
- "නවෝදය" සජීවකයින්ට මූලික නීතිය පිළිබඳ පුහුණුවීම් ලබාදීම.
- "නවෝදය" ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන වතුකරයේ ජනතාවගේ මූලික නීතිමය ගැටළු වලදී සහාය දැක්වීම.
- වතුකරයේ උප්පැන්න සහතික ලබාගෙන නොමැති ජනතාවට ඒවා ලබාගැනීම සඳහා අවශ්‍ය දැනුවත් කිරීම් සිදු කිරීම හා ඒ සඳහා ජංගම සේවා පැවැත්වීම.
- වතුකරයේ ඡන්ද බලය ලබා නොමැති ජනයාට ඡන්ද අයිතිය ලබාදීම සඳහා අවශ්‍ය දැනුවත් කිරීම් සිදුකිරීම හා ඒ සඳහා ජංගම සේවා පැවැත්වීම.
- වතුකරයේ මෙතෙක් ජාතික හැඳුනුම්පත් ලබාගෙන නොමැති ජනතාවට ඒවා ලබාගැනීම සඳහා අවශ්‍ය දැනුවත් කිරීම් සිදු කිරීම හා ඒ සඳහා ජංගම සේවා පැවැත්වීම.
- වතුකරයේ කතෝලික ජනයා වෙනුවෙන් ඔවුන්ගේ ආගමික සංවර්ධනය සඳහා වාර්ෂික ඥානකාන්තියක් පැවැත්වීම.

- වතුකරයේ සංස්කෘතික අනන්‍යතාවය හා වතුකර දරු දැරියන්ගේ සංස්කෘතික දක්ෂතා ඔප්නැංවීම සඳහා "නවෝදය දිනය" නැමති සංස්කෘතික උත්සව දිනය සංවිධානය කිරීම.

***<u>කාන්තා, තරුණ හා ළමා සුභසාධනය.</u>***

- "නවෝදය" සජීවකයින්ට කාන්තා අයිතිවාසිකම් පිළිබඳ පුහුණුවීම් ලබාදීම හා ඔවුන් මගින් වතුකරයේ කාන්තාවන්ට අදාල දැනුවත් කිරීම් සිදුකිරීම.
- ජාත්‍යන්තර කාන්තා දිනය හා ජාත්‍යන්තර ළමා දිනය වෙනුවෙන් විශේෂ උත්සව සංවිධානය කිරීම.
- "නවෝදය" සජීවකයින්ට ළමා අයිතිවාසිකම්, ළමා සමාජ පිහිටුවීම පිළිබඳ පුහුණුවීම් ලබාදීම හා ඔවුන් මගින් වතුකරයේ ළමා සමාජ පිහිටුවීම.
- එම ළමා සමාජ වතු දරු දැරියන්ගේ නිර්මාණශීලීත්වය, පෞර්ෂත්වය නංවාලීමට කවික, නර්තන, සංගීත, රචනා හා විවිද තරඟ සංවිධාන කිරීම හා ජයග්‍රාහකයිට ත්‍යාග ලබාදීම.
- වතුකරයේ යෞවන සමාජ පිහිටුවීම හා ඔවුන් සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබාදීම.